# චීන-ලංකා වෙළෙඳ සබඳතා : අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා

*ඉෂාරා සුරංජි පෙරේරා* [1]

පෙර-අපර දෙදිග කේන්ද්‍රස්ථානයක පිහිටා තිබීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලංකාව පෙරදිග රටවල් සමග පැවැත් වූ සබඳතා අතුරින් ප්‍රථම ස්ථානයට පත්වන්නේ චීනය සමග පැවැත් වූ වෙළෙඳ සබඳතාවයි. මුහුදු මාර්ගය ඔස්සේ සිය ගනුදෙනු පවත්වා ගැනීමේදී චීනයටද ශ්‍රී ලංකාව වැදගත් සන්ධිස්ථානයක් වූ අතර, චීන වෙළෙඳුන් විසින් මෙරටට ගෙන එන ලද පට-පිළී වර්ග ලංකාවේදී පර්සියානු වෙළෙඳුන් ඔවුන්ගෙන් මිලට ගෙන රෝමයට ගෙන ගොස් යුරෝපීය වෙළෙඳුන්ට අලෙවි කර ඇත. අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා වරින් වර මෙබඳු වෙළෙඳ සබඳතා පවත්වා ඇති අතර, එහිදී ශ්‍රී ලංකාව වෙළෙඳ ද්‍රව්‍ය හා භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ මධ්‍යස්ථානයක් වශයෙන් යොදා ගෙන තිබේ.

චීනය හා ලංකාව අතර පැවැති වෙළෙඳ සබඳතාවල ස්වරූපය හා එමගින් ඇතිවූ ප්‍රතිඵල පරීක්ෂා කිරීමේ අරමුණින් සිදු කෙරුණු මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය කෙරිණ.

චීනය හා ලංකාව අතර පැවති වෙළෙඳ සබඳතා සමෘද්ධිමත් වූයේ චීනයේ තාං (ක්‍රි. ව. 610-907) සහ සුං (ක්‍රි. ව. 426) රජ පෙළපත් කාලයේදීය. මේ කාලයේදී මුහුදු මාවත ඔස්සේ සිදු කෙරුණු වෙළෙඳ කටයුතු ඔස්සේ චීනයේ සිට මෙරටට පිඟන් භාණ්ඩ, පට-පිළී, ආදිය රැගෙනවිත් ඇති අතර, මෙරටින් මුතු, මැණික්, ඇත්දත් හා ආභරණ ආදි භාණ්ඩ චීනයට ගෙන යනු ලැබිණ. ලංකාවේ පැරණි වරායන් ආශ්‍රිතව හමුවන පුරාවිද්‍යාත්මක සාධකවලින් දෙරට අතර පැවැති මෙම වෙළෙඳ සබඳතාවන්හි ස්වරූපය තවදුරටත් තහවුරු වෙයි. තං පෙළපත් යුගයට අයත් සේ සැලකෙන චීන බඳුන් මහාතිත්ථ වරායෙන් හමු වී තිබේ. ඊසානදිග වෙරළෙහි වන්කලෙයි, කයිට්ස් දූපතෙහි අල්ලයිපිඩ්ඩි සහ යාපනය අතර වෙරළ තීරයෙන් දකුණු සුං යුගයට අයත් පිඟන් භාණ්ඩ කැබලි හමුවී තිබේ. අභයගිරි විහාර සංකීර්ණයෙන් හමුවී ඇති චීන මැටි බඳුන් මඟින් තහවුරු වන්නේද දෙරට අතර පැවති වෙළෙඳ සබඳතාය.

මෙරටින් හමුවන චීන කාසිද චීන-ලංකා වෙළෙඳ සබඳතා පිළිබඳ අධ්‍යයනය කිරීමේදී යොදාගත හැකි පැහැදිලි සාධකයක් වන අතර, මේ ලිඛිත හා

පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය අනුව අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා වරින් වර දෙරට අතර විවිධ ස්වරූපයේ වෙළෙඳ සබඳතා පැවති බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ** මුතු, මැණික්, පිඟන් භාණ්ඩ, ඇත්දත්, චීන කාසි

[1]*ඉතිහාස අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. suranjiperera89@gmail.com*